

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

7 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/ විභාග අංකයඃ ..........................................  කාලය : පැය 2 යි

**I කොටස**

- සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මව, පියා, දරුවන් පමණකින් සමන්විත පවුල හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?
   1) සංකීර්ණ පවුල  2) න්‍යෂ්ටික පවුල
   3) විස්තෘත පවුල  4) විස්තීර්ණ පවුල

02. කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්දව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර හඳුන්වනු ලබන්නේ,
   1) තොරතුරු මූලාශ්‍ර  2) සටහන් මූලාශ්‍ර
   3) විශේෂ වාක්‍ය මූලාශ්‍ර  4) දත්ත මූලාශ්‍ර

03. විභාගය හොඳින් සමත්වීමට නොකළ යුතු වන්නේ,
   1) අධ්‍යාපන කටයුතුවල නිරතවීම  2) කාලසටහනකට අනුව වැඩ නොකිරීම
   3) දිනපතා පාසල් යාම  4) ගුරුවරුන්ට කීකරු වීම

04. සමාජයේ හිතකර බලවේගයක් නොවේ,
   1) පවුල  2) පාසල
   3) සූදුපොළ  4) ආගමික ආයතන

05. ''ගුරුන් ගුණ මහතය ....'' මෙම කවිය අඩංගු ග්‍රන්ථය වන්නේ,
   1) සිරිත් මල්දම  2) ලෝවැඩ සඟරාව
   3) ලෝකෝපකාරය  4) ගුත්තිල කාව්‍ය

06. ජීවිතය සාර්ථක කර ගැනීමට පිහිටුවා ගන්නා ලද නිශ්චිත අධිෂ්ඨානයන් හඳුන්වන්නේ,
   1) ආත්මාභිමානය  2) අභිමානය
   3) ජීවන ක්‍රියාවන්  4) ජීවන අරමුණු

07. හොඳ පොත්පත් කියවීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවේ,
   1) නව දැනුම ලැබීම  2) ජීවිතයට අනර්ථයක් සිදුවීම
   3) විවේකය අර්ථවත්ව ගත කිරීම  4) ජීවිතය සාර්ථක වීම

08. විවේකය ඵලදායීව ගත කිරීමට යොදාගත හැකි ක්‍රමයක් නොවේ,
   1) කාටූන් නැරඹීම  2) ගීත ගායනය
   3) පොත් කියවීම  4) සංගීත භාණ්ඩ වාදනය

09. ''දුක'' ඇති වූ විට දැකිය හැකි ප්‍රතිචාරයක් නොවේ,
   1) සුසුම් හෙළීම  2) ඔල්වරසන් දීම
   3) හැපීම  4) මුහුණ මළානික වීම

10. උපන්දිනය සැමරීමට වඩාත් සාර්ථක ක්‍රමයක් නොවන්නේ,

1) දානයක් දීම
2) පාසලේ උපකරණ බෙදාදීම
3) අසරණ සතුන්ට ආහාර දීම
4) සාද පැවැත්වීම

11. විස්තෘත පවුලක් විශේෂ වීමට හේතුවක් වන්නේ,

1) පවුලේ ශක්තිය වැඩි වීම
2) ආදරය අඩු වීම
3) ශ්‍රමය ලබා ගැනීමේ අපහසුව
4) වගකීම් බෙදී නොයාම

12. ඔබ සතු අයිතිවාසිකමක් නොවේ,

1) අධ්‍යාපනය
2) ආරක්ෂාව
3) ආදරය
4) රැකියා කිරීම

13. යහපත් පුරවැසියෙකු සතු ගුණාංගයක් නොවේ,

1) අන්‍යමත ඉවසීම
2) නිහතමානිකම
3) වංකකම
4) සුහදශීලි බව

14. ඔබගේ පියාගේ අක්කා ඔබට ඇති නෑකම වන්නේ,

1) නැන්දා
2) ලොකු අම්මා
3) පුංචි අම්මා
4) කුඩම්මා

15. දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් හඳුන්වන නාමය වන්නේ,

1) සම්ප්‍රදායන්
2) චාරිත්‍ර
3) නීති
4) රීති

16. ජන සමාජයේ කුඩාම ඒකකය වන්නේ,

1) පාසල
2) පවුල
3) පන්සල
4) පල්ලිය

17. ආධ්‍යාත්මික සංවර්ධනයට දායක වන සංවිධානයක් වන්නේ,

1) ක්‍රීඩා සමාජ
2) ළමා සමාජ
3) වැඩිහිටි සමිති
4) ආගමික සංවිධාන

18. දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,

1) ජීවත්වීමේ අයිතිය
2) අධ්‍යාපනය ලැබීමේ අයිතිය
3) ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
4) රැකියාවක් කිරීමේ අයිතිය

19. පොදු සමාජයේ පැවැත්ම සඳහා පුරවැසියන් තමාට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම හඳුන්වන්නේ ,

1) අයිතිවාසිකම්
2) වගකීම්
3) වගවීම්
4) යුතුකම්

20. අභියෝග ජය ගැනීම සඳහා කළ යුතු වන්නේ,

1) ප්‍රතික්ෂේප කිරීම
2) පූර්ව සූදානම
3) කැපවීම
4) උනන්දු වීම

(ලකුණු 2 × 20 =40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1)

i. ප්‍රධාන පවුල් වර්ග දෙක මොනවා ද?

ii. ඔබේ ජීවන අරමුණු 2ක් ලියන්න.

iii. වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ජීව විද්‍යාත්මක සාධකය කුමක් ද?

iv. හිතකර බලවේග 2ක් ලියන්න.

v. පාසලෙන් ඔබේ ජීවිත සාර්ථක කිරීමට සිදු කරන ක්‍රියාකාරකම් 2ක් ලියන්න.

vi. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් 2ක් ලියන්න.

vii. විද්‍යුත් මාධ්‍ය 2ක් ලියන්න.

viii. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරතවීමෙන් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

ix. චිත්තවේග 2ක් ලියන්න.

x. බුද්ධිමත් පාරිභෝගිකයෙකු සැළකිලිමත් විය යුතු කරුණු 2ක් ලියන්න.

(ලකුණු 2× 10=20)

2)

i. ළමා අයිතිවාසිකම් 2ක් ලියන්න. (ල.2)

ii. ජන සමාජයේ සාමාජිකයින් මුහුණ දෙන අභියෝග 3ක් ලියන්න. (ල.3)

iii. අභියෝග ජය ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

3)

i. පවුලක ජීවත්වීමෙන් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න. (ල.2)

ii. පවුලක ලක්ෂණ 3ක් ලියන්න. (ල.3)

iii. පවුල වෙනුවෙන් ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

4)

i. ආත්මාභිමානය යනු කුමක් ද? (ල.2)

ii. සමාජයේ අහිතකර බලවේග 3ක් ලියන්න. (ල.3)

iii. විවේකය ඵලදායීව ගත කළ හැකි ක්‍රම 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

5)

i. අයිතිවාසිකම් යනු මොනවා ද? (ල.2)

ii. සිවිල් අයිතිවාසිකම් 3ක් ලියන්න. (ල.3)

iii. ජන සමාජයේ පුරවැසියෙකු සතු ගුණාංග 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

6)

i. සිරිත් හා විරිත් යනු මොනවා ද? (ල.2)

ii. පවුල තුළ ඇති සම්ප්‍රදායයන් 3ක් ලියන්න. (ල.3)

iii. අසල්වාසීන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)